# ‘බෙන්ඩ්ස් ’ රෝගයට ගොදුරු වන කිමිදුම්කරුවන්ට ප්‍රථමාධාර දීම

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය

සහ

ශ්‍රී ලංකා නාවික සෞඛ්‍ය සේවා ජෙනරාල් තුමාගේ කාර්යාලය

සාමූහිකත්වයෙන් පලකරන ප්‍රකාශනයකි

මෙම ලියවිල්ල පිළියෙල කර ඇත්තේ දියයට හුස්ම ගැනීමේ උපකරණ (ස්කූබා) භාවිතා කරන කිමිදුම්කරුවන් බෙන්ඩ්ස් (bends) රෝගයට ගොදුරුවන අවස්ථා වලදී ප්‍රථමාධාරයක් වශයෙනි.

බෙන්ඩ්ස් (bends) රෝග ලක්ෂණ ඇතිවූ විගස ප්‍රථමාධාර ලබා දිය යුතු හෙයින් කිමිදුම්කරුවන්ගේ, බෝට්ටු පදවන්නන්ගේ සහ අනෙකුත් අයගේ ප්‍රයෝජනය සඳහා මෙම ලියවිල්ල සකසා ඇත. එමනිසා අනතුරට ගොදුරුවන අයගේ බෝට්ටුවේ සිටින අය මෙම උපදෙස් ගැන මනාව දැනුවත්ව සිටිය යුතුය. මේ සඳහා ඇති එකම ඵලදායී නිර්දේශ කළ හැකි ප්‍රතිකාරය වන්නේ සම්පීඩන කුටියක් තුළදී අධිපීඩන ඔක්සිජන් ලබා දීමයි. මෙවැනි පිළියම් කිරීමට ඇති එකම රෝහල වන්නේ ත්‍රිකුණාමලයේ නාවික හමුදාවේ රෝහල වේ. ඉතා ඉක්මනින් මෙම රෝහලට ඇතුලත් කිරීමට අපහසුනම්, නාවික රෝහලට ඇතුළත් කිරීමට කටයුතු කරන තෙක් රෝගීන් අවශ්‍ය කටයුතු සඳහා ළඟම ඇති රෝහලකට ඇතුළත් කළ යුතුය.

## ‘බෙන්ඩිස් ’ රෝගයට ගොදුරු වන කිමිදුම්කරුවන්ට ප්‍රථමාධාර දීම

1. රෝගියා දිගු කරවා තබන්න.
2. සිහිය නොමැතිනම් රෝගියා වම් පසට හරවා දිගුකර තබන්න (සිහි ගැන්වීමේ ස්ථාපිතය).
3. රෝගියාව සනසමින්, සන්සුන්ව නිශ්චලව සිටීමට දිරිමත් කරන්න.
4. ශීතලෙන් ආරක්ෂා කරන්න. තෙත රෙදි ඉවත් කරන්න.
5. සම්පූර්ණයෙන් සිහි එළඹ සිටී නම්, මද්‍යසාරයෙන් තොර දියර වර්ග මුඛය මාර්ගයෙන් ගැනීමට දිරිමත් කරන්න.
6. රෝගියාව යාත්‍රාවෙන් ඉවත් කිරීමේදී ද, ඉන්පසු රෝහල කරා ගෙන යෑමේදී ද රෝගියා දිගු කරවා ගෙන යා යුතුය.
7. මුඛය සහ නාසය තදට වැසෙන පරිදි විශේෂ ආවරණයක් (oxygen mask) භාවිතා කොට 100% ඔක්සිජන් වායුව හැකි ඉක්මනින් ලබා දිය යුතුය. (කඩින්කඩ විනාඩි 20ක් ඔක්සිජන් වායුව සහ විනාඩි 5ක් සාමාන්‍ය වාතය ලබා දෙන්න.)
8. ත්‍රිකුණාමලයේ නාවික රෝහලට **හැකි ඉක්මණින්** ඇතුළත් කරන්න.

   කුටිය තුළ පිලියම් කිරීම සඳහා ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කිරීමට

   0262 261868 හෝ 0262 266100 (ත්‍රිකුණාමලය) අමතන්න.

   එසේ නැතිනම්, ළඟමැති රෝහලකට ඇතුළත් කරන්න.

9. වෛද්‍යවරයාට / රෝහල් කාර්ය මණ්ඩලයට කිමිදීමේදී ඇතිවූ බෙන්ඩිස් රෝග ලක්ෂණ සඳහන් කරන්න. ඒවා ඇතිවූයේ අධික ගැඹුරේ වැඩි කාලයක් ගතවූ පසු බව පවසන්න

**දිය යටදී ඔක්සිජන් ලබා දීමෙන් වළකින්න**

රෝහලේදී අධිපීඩන ඔක්සිජන් ප්‍රතිකාරය දෙන තෙක් රෝගියාට මුත්‍රා පිට කිරීමට අපහසු නම්, මුත්‍රා බටයක් යෙදීම, සේලයින් ලබා දීම සහ තද මුහුණ ආවරණයක් භාවිතයෙන් 100% ඔක්සිජන් වායුව ලබා දෙන්න. (කඩින් කඩ විනාඩි 20ක් ඔක්සිජන් වායුව සහ විනාඩි 5ක් සාමාන්‍ය වාතය ලබා දෙන්න.)

**විශේෂයෙන්, නාවික රෝහලට රෝගියා යැවීමේදී කිමිදුම් ක්‍රියාවලිය (සිලින්ඩර් ප්‍රමාණය, දිය යට ගතවූ කාලය, සිලින්ඩර් මාරු කිරීමට යාත්‍රාවේ ගතවූ විවේක කාලය ආදිය) ගැන සහ රෝග ලක්ෂණත්, ඒවා පහලවීමට ගතවූකාලය ද පහලවීමෙන් පසු සිදු කරන ලද දේ පිළිබඳ දන්නා අයෙකු සමග යැවිය යුතු වේ.**

## ‘බෙන්ඩ්ස් ’ රෝග ලක්ෂණ

හන්දිපත් හෝ කොන්දේ රුදාව ♦ හිරිවැටීම ♦ කකුලක හෝ අතක අප්‍රාණික බව ♦ කැසීම ♦ සමෙහි රතු ලප හෝ ඉරි මතු වීම ♦ පෙනීමේ ආබාධ ♦ කන් හෝගෑම ♦ නිලංකාරය ♦ ක්ලාන්ත ගතිය ♦ මුත්‍රා පහ කිරීමට නොහැකි බව



## බෙන්ඩිස් උපකාර ක්ෂණික ඇමතුම්

උපදෙස් අවශ්‍ය ද? ප්‍රශ්න තිබේ ද?

අමතන්න –

වෛද්‍ය E. W. ජයසිංහ – 0777849284

වෛද්‍ය මලික් ප්‍රනාන්දු – 0777678606

ඩැරල් ෆ්‍රයර් මයා – 0777482683

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය

සහ

ශ්‍රී ලංකා නාවික සෞඛ්‍ය සේවා ජෙනරාල් තුමාගේ කාර්යාලය

වෙනුවෙන් සංස්කරණය

මලික් ප්‍රනාන්දු

නොවැම්බර් 2013

ප්‍රකාශක
ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය
6, විජේරාම මාවත
කොළඹ 7

Updated May 2018